# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2148/21 - 2019 නොවැම්බර් මස 05 වැනි අඟහරුවාදා - 2019.11.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2141/87, 2019.09.21 දිනැතිව හා අංක 2146/39, 2019.10.27 දිනැතිව නිකුත් කරන ලද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පිළිපැදිය යුතු මාධ්‍ය උපමාන හා සම්බන්ධිතව මැතිවරණ කොමිෂන් සභාව විසින් අමතරව නිකුත් කරනු ලබන මාධ්‍ය උපමාන**

මැතිවරණ ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් ''නිහඬ කාලය'' යනු ඡන්ද විමසීම පැවැත්වීමට නියම කරන ලද දිනයට පැය 48 කට පූර්වයෙන් ආරම්භ වී ප්‍රතිඵල ප්‍රකාශ කරන තෙක් කාලය යි. මෙම කාලය තුළ දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයකු, ප්‍රවර්ධනයට හෝ අගතියට හේතුවන පරිදි කිසිදු ආකාරයක ප්‍රචාරක කටයුත්තක් හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රසිද්ධ කිරීමක් සිදු කරනු නොලැබිය යුතු ය.

කෙසේ වතුදු නිහඬ කාලය ආරම්භ වීමට පූර්වයෙන් වූ දිනයේ දී දේශපාලන පක්ෂ හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා පවත්වනු ලබන ප්‍රසිද්ධ රැස්වීම් පිළිබඳව වාර්තා, එකී රැස්වීම පැවැත් වූ දිනයට පසු දින ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකාවල ප්‍රවෘත්ති විකාශය කෙරෙන එක් අවස්ථාවක දී පමණක් තරග කරන පක්ෂවලට හෝ අපේක්ෂකයන්ට සමාන කාලසීමාවක් ලැබෙන පරිදි ප්‍රචාරය කළ හැකි ය. එමෙන්ම අදාළ අවසන් මහා රැස්වීම් පැවැත් වූ දිනට පසු දින ප්‍රකාශයට පත් කරන පුවත්පත්වල ද අවසන් දින රැස්වීම්වල වාර්තා කිසිදු පක්ෂයකට හෝ අපේක්ෂකයකුට විශේෂ සැලකිල්ලක් නොලැබෙන පරිදි ප්‍රසිද්ධ කළ හැකිය.

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය | එන්. ජේ. අබේසේකර | එස්. රත්නජීවන් එච්. හූල් |
| සභාපති | සාමාජික | සාමාජික |
| මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව |

2019 නොවැම්බර් මස 05 වැනි දින,<br>මැතිවරණ කොමිෂන් සභාව,<br>සරණ මාවත,<br>රාජගිරිය.

11 - 1407

1A - PG 4742 — 167 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*